The Problems of Commitment and Conscience as reflected in Pietro Spina in Ignazio Silone's *Bread and Wine*

Eisha Manohari Hewabowala

මෙම ලිපියෙහි අරමුණ වනුයේ 20 වන සියවසේ ප්‍රබල ඉතාලියානු දේශපාලන නවකතාකරුවකු වූ ඉග්නාසියෝ සිලෝනිගේ (1900-1978) බ්‍රෙඩ් ඇන්ඩ් වයින් (1936) නමැති නවකතාවේ එන පියෙට්‍රෝ ස්පීනා නම් වූ තරුණ, කඩවසම්, බුද්ධිමත්, අතිශය සංවේදී ප්‍රධාන චරිතයට මුහුණ පෑමට සිදුවන තදබල මානසික අර්බුදකාරී තත්ත්වය ගවේෂණය කිරීමයි.

ඔහු විප්ලවකාරී, අතිශය ක්‍රියාශීලී චරිතයකි, එහෙත්, රෝගී තරුණ පූජකවරයකු ලෙස වෙස්වලා ගෙන හැදුණු වැඩුණු, ගහනම්, ඉතාමත් දිළිඳු අබ්රුසි ගම්මානයට රහසිගතව පැමිණ, ජීවත්වීමට ඔහුට සිදුවෙයි. පැහැදිලි, විප්ලවකාරී පදනමකින්, එදා ඉතාලි අධිරාජ්‍යවාදය තුළින් තැවගත, රටේ දැවෙන ප්‍රශ්න විසඳීමට, ඔහු නිරන්තරයෙන් මහන්සි ගති. නමුත්, මෙම විප්ලවකාරී අරමුණු කැටිකර ගත් කැපවීම, ඔහුගේ සහජ මානුෂික හැඟීම්වලට නොගැළපේ. එම බලපෑම් තුළින්, ඔහු ක්‍රම ක්‍රමයෙන්, දැඩි විඩාවට ලක්වෙයි. ඉතාම සූක්ෂම අන්දමින්, ඔහු මෙම ප්‍රශ්න විසඳීමට වෙර දරන ආකාරය, මෙම ලිපිය විදහා දක්වයි.

ඉතාමත් ආකර්ෂණීය පෙනුමක් ඇති ඔහුට, පූජක ලෝගුව මනාව ගැළපෙයි. එය ඔහු සිතන පතන ආකාරයෙහි සහ ඔහුගේ අභ්‍යන්තරය තුළ ඉතා විශාල වෙනසක් ඇති කරයි. ඔහුගේ විසිරුණු සිත එතුළින් පාලනය කිරීමට හැකිවෙයි. ක්‍රමයෙන්, විප්ලවකාරී ගමනක ඇති කටුක බව සහ නිෂ්ඵල බවත්, ගතානුගතික සම්ප්‍රදායන්ගෙන් පෝෂණය වූ අති සුන්දර මානුෂික ගුණයන් තුළ සැඟවුණු සහනතාවත්, මෙම ඉතාලියානු නවකතාකරු ඉතාම සූක්ෂම ව සහ සංවේදී ව පාඨකයාට පෙන්වා දෙයි. මෙම අන්දමින් වටා ගෙතුණු ඔහුගේ ජීවිතය,

© Eisha Manohari Hewabowala

සංස්. පූජ්‍ය මිකුලෙව්වේ ධම්මානන්ද හිමි, නිමල් මල්ලව ආරච්චි, සරත්සිරි කෝන්ගොඩ, මහිම රණසිරි
භාෂාශාස්ත්‍ර පීඨ ශාස්ත්‍රීය සංග්‍රහය, 9 කලාපය, 2009, භාෂාශාස්ත්‍ර පීඨය, කැලණිය විශ්වවිද්‍යාලය